(විරිදු සංවාදයක්)

## සොඳුරු ළමා වියෙන් බිඳක්

1. මල්ලි > අක්ක මගේ රත්තරන්
අක්ක > මල්ලි මගේ රත්තරන්
දෙදෙනාම > අපි දෙන්නගෙ බාල කාලෙ
අපි දෙන්නට රත්තරන්

2. මල්ලි > පුංචි අක්කෙ මට මතකයි අපේ පුංචි කාලේ
පුංචි පුංචි දඟ වැඩ කර හැංගි හිටිය කාලේ
අක්ක > පොඩි මල්ලියෙ මතකයි මට අල්ලා අත් දෙන්නා
පුංචි කුරුළු පැටවු වගේ වෙල් එළියට පැන්නා

3. මල්ලි > දිය මංකඩ පිපී දිලෙන ඕළු-නෙළුම් නෙළලා
මාල ගොතා හුරතලේට අත-කර සරසාලා
අක්ක > ගොටුකොළ - තණපලා නෙළා අම්මගෙ හිත දිනලා
දොළ පහරේ - මහ නියරේ තරඟෙට අපි දුවලා

4. මල්ලි > ඉපනැල්ලේ ගොයම් කරල් ඇහින්දෙ අපි දෙන්නා
වක්කඩ ලඟ තිත්ත පැටවු ඇල්ලුවෙ අපි දෙන්නා
අක්ක > පොඩි මල්ලියෙ ඔයත් එක්ක පලවා බිය සංකා
සිරිපා කඳුවැටි බලන්න ගස් මුදුනට නැංගා

5. මල්ලි > තාත්ත ගහ යටින් යද්දි අපි නිහඬව උන්නා
අක්කෙ ඔයා මගෙ දිවියට අත්වැල වී උන්නා
අක්ක > ගොරක ගහේ වෙරළු ගහේ පල දරනා කාලේ
අපි දෙන්නා රජ වීලා හිටිය බාල කාලේ

6. මල්ලි > ගං වතුරේ පොල් ගෙඩි බැඳ එගොඩට පීනාලා
මෙගොඩට පෙරලා ආවේ අපි තරඟෙට වැදිලා
අක්ක > ගං වතුරේ දිය සුළියක යනවිට මා ගිලිලා
ඔයා නේද මා බේරුවෙ වීරය වගෙ පැනලා

7. මල්ලි > සැඬ පහරේ කෙසෙල් කඳන් පහුරු සදා පාවි යන්න
පෙරළි පෙරළි වතුරට පැන මාළු පැටව් හඹා යන්න
අක්ක > මගෙ එඩිතර පොඩි මල්ලිය කළ විස්කම් මතකයි
මගෙ දිවියට සෙවනැල්ලක් වී සිටියා මතකයි

8. මල්ලි > වෙලේ ළිදෙන් නාලා කුරු පොල් ගහකට නැගලා
කුරුම්බ ගෙඩි ළිඳට දමා හොර රහසේ බීලා
අක්ක > කජු වාරෙට පාන්දරින් හොරෙන්ම නැගිට්නවා
වවුලන් කෑ පුහුලන් කජු පින්නෙම ඇහිඳිනවා

9. මල්ලි > රබර් යායෙ සට පට ගා කටු පුපුරන්නා
ඔට්ටුපාළු බෝල තනා අපි දුව පැන්නා
අක්ක > කොට්ටන් ගෙඩි එකතු කරන් අව්වේ වේලාලා
තලලා මද කෑවා අපි රස කර තලු මරලා

10. මල්ලි > තරගෙට අපි සරුංගෝල උඩු ගුවනට යැව්වා
තරඟ වෙවී යාළු වෙවී නූල් ඇදන් දිව්වා
අක්ක > කොලු නඩයේ පෙරමුණ ගෙන මහ වනරොද පීරා
දං, බෝවිටි, හිඹුටු සොයා ගියෙ බඩවැටි පීරා

11. මල්ලි > වෙසක් දිනේ පැටව් පිරුණ අටපට්ටම් තනලා
මරඟන දූවරු රඟනා සල් උයනක් මවලා
අක්ක > බුදුරැස් විහිදෙන විදිහට විදුලි බුබුලු දමලා
ඔයා නේද හැඩවැඩ කලෙ නෙක විස්කම් මවලා

12. මල්ලි > පැල ඉනි වැට බැඳලා පොඩි සෙල්ලම් ගේ හදලා
පොල් අතු අහුරා හොඳහැටි වහලෙ සෙවිලි කරලා
අක්ක > පෝයදාට කැළණි ගිහින් ගෙනා වළං තියලා
අම්මා දුන් හාල් මිටෙන් රජ බොජුනක් හදලා

13. මල්ලි > සෙල්ලම් ගෙයි අපි එක්වී අල දෝසිත් හැදුවා
සව් ඇට බැද පැණි දාගෙන මතකද අපි කෑවා
අක්ක > අන්නසි අඹ කපලා හොඳ පදමට ලුනු දමලා
වෙරළු තම්බලා එක්කර අච්චාරුව හදලා

14. මල්ලි > කජු ගහ මැද දෙබලට වී හැංගී රහසින්නේ
නිදැල්ලෙ එහෙ මෙහෙ ගියානෙ දඟ වැඩ කරමින්නේ
අක්ක > මිදුලේ උගුරැස්ස ගහේ ගෙඩි රතුවෙන කාලේ
වවුලන් සේ දවස පුරා ගහේ හිටිය තාලේ

15. මල්ලි > හුරතල් අපෙ බලුපැටියා මළ දවසේ අඬලා
මතකද අපි පෙරහැරකින් ගෙනගියෙ බෙර ගහලා
අක්ක >අවුරුදු කාලෙට කජු ගහෙ ඔන්චිල්ලා බැඳලා
මල්ලිව ඉන්දා පැද්දුව ඔන්චිලි-චිලි කියලා

16. මල්ලි > පුංචි කාලෙ මා නාවා ගුලිකර බත් කවලා
උකුලෙ තියා නිදි කරවා දොයි දොයි දොයි කියලා
අක්ක > පියාගෙ ඔවදන් අහලා පාඩම් වැඩ කරලා
අපි දෙන්නා දුව පැන්නා අස්ස-ගුඩුං කියලා

17. මල්ලි > කොළපත උඩ මා ඉන්දා අල්ල ගන්න කියලා
අක්ක මාව ඇදගෙන ගොස් පැනලා ගියෙ පෙරලා
අක්ක > කොස් කොළ තොප්පියක් හිසට, මිරිවැඩි සඟලක් දෙපයට
බඳ පටියක් ඉන වටේට, කඩුවක් අරගෙන සුරතට

18. මල්ලි > හිමිදිරියේ වෙලට ගොසින් වක්කඩ බැඳ එන්නේ
තේජවන්ත රජෙකු වගේ තාත්ත සිහි වෙන්නේ
අක්ක > දිවා රැයේ වෙහෙස වෙලා රස බෝජන හදලා
අපෙ ආදර රන් අම්මා සිහිවෙයි මට මැවිලා

19. මල්ලි > අනේ අක්කෙ ඒ කාලය ආයෙත් නෑ එන්නේ
මතකයෙ සුවඳක් පමණයි නැවුම්ව ළංවන්නේ
අක්ක > දඟ වැඩ කර හුරතල් වුණ අපෙ සුමිහිරි බාලේ
හීනෙන් ඉඳහිට පෙනෙනව මල්ලියෙ මේ කාලේ

20. දෙදෙනාම > සංසාරේ හැම භවයෙම අත්බැඳ අපි දෙන්නා
අක්ක මලෝ වාගේ යමු නිවන් පුරට දෙන්නා

හිඹුටානේ
කල්‍යාණී සෙනරත් යාපා
2004 නොවැ 30